

කැලණි පුද බිමේ ඓතිහාසික පසුබිම

## ꧁ මුගලන් හිමියන්ගෙන් 'මාරයා'ට අනතුරු ඇඟවීමක්

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි
'සූත්‍ර ධර්ම විවරණ' විශේෂාංගය යටතේ බුදුරදුන්ගේ අග්‍රශ්‍රාවක මහ රහත් හිමිවරුන් දෙදෙනාගෙන් එක් අයකු වූ මුගලන් හිමියන් පිළිබඳ සිද්ධියක් ඇසුරෙන් ලියැවුණු ලිපියකි. බුදු දහමෙහි සඳහන් වන 'මාර දිව්‍ය පුත්‍ර' සංකල්පය ඇතුළත් පුවතකි, මෙහි දක්වෙන්නේ.

## ꧁ මහියංගණය හා බැඳුණු ඓතිහාසික හා පුරා විද්‍යාත්මක විවරණයක්

බුදු හිමියන් වැඩම කළ පුද බිමක් හැටියට සැලකෙන මහියංගණය පිළිබඳ ඓතිහාසික තොරතුරු. පුරා විද්‍යා ගවේෂණවලදී හෙළි වූ ශාසනික වශයෙන් වැදගත් දුර්ලභ තොරතුරු කිහිපයක් – මෙම ලිපියට ඇතුළත් ය.

## ꧁ කැලණි පුද බිමේ ඓතිහාසික පසුබිම

– සිරිසමන් විජේතුංග
බුදු හිමියන් වැඩම කළ පුද බිමක් හැටියට සැලකෙන කැලණි රජ මහ වෙහෙර පසුබිම් කර ගත් ඉතිහාසගත කතන්දරය.

## ꧁ භික්ෂු ආකල්ප සම්පත්තිය හා ආචාර – සමාචාර විධි

– වැහිගල හේමාලෝක නාහිමි
එද මෙද තුර බුදුසසුනේ චිරස්ථිතියට බල පෑ – මහා සංඝ රත්නයේ චර්යා රටාව. ජීවිතය පිළිබඳ උන්වහන්සේ පළ කළ ආකල්ප සමුදය සහ ශාසනික කටයුතුවලදී හා එදිනෙද ජීවිතය තුළ දී උන්වහන්සේ වෙත දක්නට ලැබුණු ආචාර – සමාචාර පිළිවෙත් සමූහය – ඉතිහාසය පුරා බුදු සසුනේ ව්‍යාප්තියට සුවිශේෂ හේතුවක් වූ ආකාරය.

## ꧁ බුදු සිරි පා පහස ලත් මහියංගණය

– පියතිස්ස කුමාරසිංහ
මහියංගණ පුද බිම ඇසුරු කොට ගත් ඓතිහාසික ශාසනික පුවත. මහියංගණයට බුදු හිමියන් වැඩම කිරීම පිළිබඳ ශාසන ඉතිහාසගත තොරතුරු.

## ꧁ මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 11

– දෙලොස්වල උදිතධීර හිමි
බුදුරදුන් විසින් ඉදිරිපත් කරන ලද විමුක්ති පිළිවෙතෙහි 'කඩ ඉම්' වශයෙන් සැලකෙන බුද්ධි මට්ටම් ලබාගැනීම – බොහෝ දෙනා සිතන තරම් අසීරු වූවක් නොවන බව පැහැදිලි කිරීමට උත්සාහ කරන ලිපි පෙළක එකොළොස් වැනි ලිපිය.

## ꧁ බුදු දහම හඳුන්වා දෙන පුද්ගල සංවර්ධනය

– බී. ඒ. විමලසේන
පුද්ගල පෞරුෂ සංවර්ධනය උදෙසා බුදු දහම තුළින් ලබා ගත හැකි මග පෙන්වීම. බෞද්ධ විමුක්ති පිළිවෙතෙහි අතුරු ඵලයක් ලෙස හැඩ ගැසෙන පුද්ගල චරිත සංවර්ධනය පිළිබඳ විග්‍රහ කැරෙන ලිපියකි.

## ꧁ දිවි මල් දමට සොඳුරු සුවඳක්

– කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි
දුරුතු පසළොස්වක පෝද ධර්ම දේශනාව යටතේ 'ධම්මපද' ග්‍රන්ථයේ සඳහන් ගාථාවකට අර්ථ විවරණයක්. මිනිස් දිවියක් ලද අයකු විසින් නිවන් මග කුසලතා වැඩිය යුතු අයුරු – උපමාවක් ඇසුරෙන් පැහැදිලි කරන ලද බුදු වදනකි, එම ගාථාවෙන් දක්වෙන්නේ.

## මියගිය අයට දක්වන අවසන් ගෞරවය

– ඒ. එම්. ප්‍රේමරත්න

මරණය පිළිබඳ ගැඹුරු දහමක් ඇතුළත් බුදු දහමට සවන් දෙන අය – පුද්ගලයකුගේ මරණය විෂයෙහි සිතිය යුතු – පිළිපැදිය යුතු ආකාරය. අවමඟුල් උත්සවවලදී වර්තමානයේ සිදු කැරෙන විවිධ සිරිත් – විරිත් පිළිබඳ විවේචනයක් ද මෙම ලිපියෙහි ඇතුළත් ය.

## Buddhism and peace

***-By Ven. Katumuluwe Sumanajothi Ketumati Buddhist Vihara, Manchester, United Kingdom***

## අපිත් 'වඩමු' ජය සිරි මහ බෝධිය

– වතුරුගම නන්දසිරි හිමි

පුහුදුන් බව ඉක්මවීම; බොහෝ දෙනා සිතන තරම් අසීරු කටයුත්තක් නොවන බවත්, ඇතැම් අය – තමන් නොදැනුවත්වම පුහුදුන් බව ඉක්මවා ඇති බවත් – එසේ තමන් පුහුදුන් බව ඉක්මවා ඇති බව වටහා ගත හැකි වන ආකාරයත් මෙම ලිපියෙන් විස්තර කැරේ. 'බෝධිය' නමැති මානසික තත්ත්වය තමන් තුළ වර්ධනය කර ගැනීමේ වැදගත්කම මෙම ලිපියෙන් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත.